# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2054/2 - 2018 ජනවාරි මස 15 වැනි සඳුදා - 2018.01.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

**2017 වර්ෂයේ අංක 02 දරන උතුරු පළාත් සංචාරක කාර්යාංශය ප්‍රඥප්තිය**

උතුරු පළාත් පළාත් සභාව විසින් 2017 වර්ෂයේ අගෝස්තු මස 24 වෙනි දින සම්මත කරන ලද 2017 වර්ෂයේ අංක 02 දරන උතුරු පළාත් සංචාරක කාර්යාංශය ප්‍රඥප්තිය සඳහා උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018 වර්ෂයේ ජනවාරි මස 10 වෙනි දින අනුමැතිය ලබා දී තිබෙන බව මෙයින් දැනුවත් කරනු ලැබේ.

**කේ. තෙයිවේන්ත්‍රිම්,**
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

සභා ලේකම් කාර්යාලය,
ඒ 9 මාර්ගය,
කයිතඩි,
2018 ජනවාරි මස 11 වැනි දින.

**උතුරු පළාත් සංචාරක කාර්යාංශයක් පිහිටුවීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.**

පෙරවදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත් සභාව විසින් පහත සඳහන් පරිදි නීති පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

1. මෙම ප්‍රඥප්තිය 2017 අංක 02 දරණ උතුරු පළාත් සංචාරක කාර්යාංශය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, මෙම ප්‍රඥප්තිය සඳහා උතුරු පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලබාදෙනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස
## උතුරු පළාත් සංචාරක කාර්යාංශය පිහිටුවීම

සංචාරක කාර්යාංශය පිහිටුවීම

2. (1) මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා (මෙහි මින්මතු, ''කාර්යාංශය'', යනුවෙන් සඳහන් කරනු ලබන)උතුරු පළාත් සංචාරක කාර්යාංශය යනුවෙන් හඳුන්වනු ලබන කාර්යාංශයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කාර්යාංශය එහි නාමය සහ අභිධානය යටතේ අවිච්ජින්න පැවැත්මක් ඇති හා පොදු මුද්‍රාවක් තබා ගත හැකි සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

කාර්යාංශයේ අරමුණු

3. මෙම කාර්යාංශයේ අරමුණු වනුයේ :-

(අ) සංචාරක කටයුතු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව උතුරු පළාත තුළ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම,

(ආ) උතුරු පළාත් සභා සීමාව තුළ 2005 අංක 38 දරණ සංචාරක පනතේ විධිවිධාන වලට යටත්ව තිරසාර ආකාරයකින් සංචාරක කර්මාන්තය ඇතුළුව ප්‍රමාණවත්, ආකර්ෂණීය, කාර්යක්ෂමව සංචාරක සේවා සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීමත්,

(ඇ) ශ්‍රී ලංකාවේ පිළිගත් සංචාරක සංගම්වල සහයෝගයෙන් උතුරු පළාත තුළ සංචාරක කර්මාන්තයට අදාළ තොරතුරු රැස්කිරීම සහ එම තොරතුරු, සිතියම් සහ අනෙකුත් කාරණා පළ කිරීම,

(ඈ) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ උතුරු පළාත තුළ එම කර්මාන්තය හා සම්බන්ධ ප්‍රවර්ධන හා පුහුණු කටයුතු සඳහා සහභාගී වීමට පුද්ගලික අංශයේ නියුක්ත / රාජ්‍ය අංශයේ නියුක්ත පුද්ගලයන් හෝ පුද්ගල මණ්ඩල දිරි ගැන්වීම;

(ඉ) ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුළුල් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා දායකත්වයක් ලබාදීම තහවුරු කිරීම පිණිස සංචාරක කර්මාන්තය හා සංචාරක අංශ වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම.

(ඊ) 2005 අංක 38 දරණ සංචාරක පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

(උ) ශ්‍රී ලංකාව තුළ හා විදේශයන්වල උතුරු පළාත සංචාරක හා සංචාරක ගමනාන්තයක් වශයෙන් සංවර්ධනය කිරීම;

කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය

4. (1) කාර්යාංශයේ කටයුතු පහත තැනැත්තන්ගෙන් සමන්විත කළමනාකරණය මණ්ඩලය (මින්මතු , ''මණ්ඩලය'', වශයෙන් හැඳින්වෙන)මඟින් පරිපාලනය හා කළමනාකරණය කළ යුතුය.

(අ) නිලබලයෙන් පත්වූ සාමාජිකයන් පස්දෙනෙක්

(i) සංචාරක කර්මාන්ත විෂය භාර උතුරු පළාත් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්;

(ii) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මුදල් උතුරු පළාත ;

(iii) පළාත් පාලන විෂය භාර උතුරු පළාත් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්;

(iv) සමාජ සේවා විෂය භාර උතුරු පළාත් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ සමාජ සේවා විෂය සම්බන්ධයෙන් උතුරු පළාත් අධ්‍යක්ෂකවරයා; සහ

(v) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාගේ උපදේශකත්වයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු; සහ

(ආ) සංචාරක කටයුතු පිළිබඳ විෂය භාර (මෙහි මින්මතු, ''අමාත්‍යවරයා'', යනුවෙන් සඳහන් කරනු ලබන)අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින්මතු , ''පත්කළ සාමාජිකයන්'', යනුවෙන් සඳහන් කරනු ලබන)පහත සඳහන් වෙනත් යම් සාමාජිකයන් පස්දෙනෙකු.

(i) උතුරු පළාත් සංචාරක සංගමයේ සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු.

(ii) සංචාරක කටයුතු පිළිබඳ ප්‍රසිද්ධියක් උසුලන සහ පිළිගත් සුදුසුකම් ඇති නවාතැන් සහ ගමනාගමනය අනු - අංශ ඇතුලුව සංචාරක ක්ෂේත්‍රයේ තැනැත්තන් හතර දෙනෙකු.

(2) කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා ද විය යුතු, සංචාරක ක්ෂේත්‍රයේ සුදුසුකම් සහ පළපුරුද්ද සහිත පුද්ගලයකු කාර්යාංශයේ සභාපතිවරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත්කළ යුතු ය.

(3) සෑම පත් කළ සාමාජිකයකු ම, මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා කලින් ධුරය හිස් කරතහොත් මිස ඔහු පත් කරන ලද දිනයේ සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් එසේ කිරීම සුදුසු යයි සලකනු ලබන විට දී, හේතු දක්වා යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(5) යම් පත්කළ සාමාජිකයකුට ඕනෑම අවස්ථාවක දී ලියාපදිංචි තැපෑලෙන් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) යම් පත්කළ සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් (1)වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන එම සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්ත වීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරනු ලබන යම් සාමාජිකයකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(7) යම් පත්කළ සාමාජිකයකු අසනීපවීම, අබලතාවයකට පත්වීම හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා තම ධුරයේ කාර්ය තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා වෙත ලිඛිතව එම නොහැකියාව පිළිබඳව දැනුම් දීම එම සාමාජිකයාගේ කාර්යය විය යුතු ය. අමාත්‍යවරයා විසින් එම තොරතුරු තමා වෙත ලැබුණු විට (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

5\. (1) මණ්ඩලයේ රැස්වීම් සඳහා සනපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(2) සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක දී, එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් නිල බලයෙන් පත් වූ සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත්කළ යුතු ය. *මණ්ඩලයේ රැස්වීම් සහ සනපූරණය*

(3) මණ්ඩලයේ යම් රැස්වීමක දී, තීරණයක් ගැනීම සඳහා වූ සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය. ලැබී ඇති ඡන්ද සංඛ්‍යාව එක සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් හිමිවිය යුතු ය.

(4) මෙම වගන්තියේ පූර්වයෙන් වූ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් එහි කාර්යපටිපාටිය විධිමත් කරගනු ලැබිය හැකි ය.

6\. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු පත්කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක් මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය. *පුරප්පාඩුවක් හේතුවෙන් මණ්ඩලයේ ක්‍රියා හෝ කටයුතු බල රහිත නොවිය යුතු බව.*

7\. මණ්ඩලයේ සාමාජිකයන්ට පළාත් සභාවේ අනුමැතිය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයෙන් හා එවැනි අනුප්‍රමාණ අනුව යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු ය. *මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.*

8\. 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තකු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත්කරනු ලැබීම සඳහා හෝ සාමාජිකයකු වශයෙන් දිගටම කටයුතු කරගෙන යාමට පහත හේතු මත සුදුස්සකු නොවිය යුතු ය. *මණ්ඩලයේ සාමාජිකයකු බවට පත්වීම සඳහා වන නුසුදුසුකම්.*

(අ) ඔහු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම් හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු නම් හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු නම් හෝ එවැනි මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත්වන්නේ නම්;

(ආ) ඔහු, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා නීතියක් යටතේ ණය ගෙවීමට නොහැකි හෝ වගකීම්වලින් බැහැර වූ, බංකොලොත් වූ අයෙකු වශයෙන් ප්‍රකාශයට පත් කර තිබේ නම්,

(ඇ) ඔහු, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු වශයෙන් තීරණය කරන ලද හෝ ප්‍රකාශ කරන ලද තැනැත්තකු වීම;

(ඈ) මාස හයකට නොඅඩු කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය හැකි චරිත දූෂණය පිළිබඳ වරදක් සම්බන්ධයෙන් වරදකරුවෙකු වී ඇති තැනැත්තකු වීම;

(ඉ) ඔහු, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද මාස 06කට වැඩි සිරදඬුවමක් හෝ අත්හිටවන ලද සිරදඬුවමකට හෝ යටත්ව සිටින තැනැත්තකු වීම, හෝ

(ඊ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අගතිදායක ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇති තැනැත්තකු වීම.

කාර්යාංශයේ මුද්‍රාව.

9\. (1) කාර්යාංශයේ මුද්‍රාව මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය.

(2) කාර්යාංශයේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයෙන් වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ අනුමතය ඇතිව මිස සහ තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි හෝ ලේඛනයේ අත්සන් තැබිය යුතු මණ්ඩලයෙන් පත් කරනු ලැබූ සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේ දී හැර කාර්යාංශයේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය.

(4) කාර්යාංශයේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

කාර්යාංශයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය.

10\. කාර්යාංශයේ බලතල, කර්තව්‍ය හා කාර්ය පහත සඳහන් පරිදි විය යුතු ය.

(අ) 2005 අංක 38 දරන සංචාරක පනතේ 2 වන වගන්තියේ සඳහන් විධිවිධාන යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ උපදේශකත්වය යටතේ කටයුතු කිරීම;

(ආ) සංචාරකයින් සඳහා ලබා දෙනු ලබන පහසුකම් වැඩි දියුණු කිරීමෙහි නියැලීම, සහාය වීම හෝ ප්‍රවර්ධනය කිරීම;

(ඇ) උතුරු පළාත තුළ සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ආයතන ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාමේ දී සහ සංචාරක සේවා සැපයීමේ දී සහාය දැක්වීම සහ සංචාරකයන් සඳහා එම සේවාවන් ලබා දෙනු ලබන තැනැත්තන් සමග එකී කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට සහය දීම;

(ඈ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම, කුලියට ගැනීම, ඔඩපනය කිරීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම;

(ඉ) මෙම කාර්යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය වන්නා වූ අධ්‍යයන, පර්යේෂණ සහ පුහුණුකිරීම් සම්බන්ධීකරණය කිරීම, ඒ සඳහා සහාය ලබා දීම සහ දිරි ගැන්වීම;

(ඊ) මුදල් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම. මෙහිදී කාර්යාංශයට ලබාදෙන සියලුම විදේශ ප්‍රදානයන්, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් රජයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමැතියක් මණ්ඩලය විසින් ලබාගත යුතු ය.

(උ) මෙම කාර්යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි යම් ගිවිසුම් හා එකඟතාවයන්ට ඇතුළත් වීම;

(ඌ) මෙම කාර්යාංශයේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, සේවය අවසන් කිරීම, වැටුප් ගෙවීම, විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඔවුන් සේවයේ නෙරපීම; සහ

(එ) මෙම කාර්යාංශයේ අරමුණු නිසි ලෙස හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ සුදුසු වෙනත් සියලු දේ ඉටු කිරීම.

## II වන කොටස
## අධිකාරියේ කාර්ය මණ්ඩලය

11. (1) කාර්යාංශයේ අධ්‍යක්ෂවරයා වශයෙන් සුදුසුකම්ලත් යෝග්‍යවූ තැනැත්තෙකුව, බඳවා ගැනීමේ පටිපාටියෙන් මණ්ඩලයේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් පත් කළ යුතුඅතර, ඔහු කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. කාර්යාංශයේ අධ්‍යක්ෂවරයා.

(2) මණ්ඩලයේ සියලු රැස්වීම් සඳහා පැමිණ සිටීමට හා එහි දී කථා කිරීමට අධ්‍යක්ෂවරයාට හිමිකම තිබිය යුතු නමුත් එවැනි රැස්වීම්වලදී ඡන්දය දීමට හිමිකම් නොලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා විසින් සභාපතිවරයාගේත්, මණ්ඩලයේත් පොදු විධානයට හා පාලනයට යටත්ව කාර්යාංශයේ නිලධරයන් හා සේවකයන්ගේ පරිපාලනමය පාලනය ඇතුළුව, කාර්යාංශයේ සියලු කටයුතු පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු ය.

(4) පළාත් සභාවේ අනුමැතිය ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් අධ්‍යක්ෂවරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ එකඟත්වය ඇතිව සහ ඒ සඳහා හේතු දක්වා (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

12. අසනීපවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා අධ්‍යක්ෂවරයාට ඔහුගේ යම් කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ එකඟත්වය ඇතිව එම නොපැමිණ සිටින කාලය තුළ දී ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා කාර්යාංශයේ වෙනත් යම් ජ්‍යෙෂ්ඨ නිලධරයකු පත් කරනු ලැබිය හැකි ය. අධ්‍යක්ෂවරයා තාවකාලිකව පැමිණ නොසිටීම.

13. (1) මණ්ඩලය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ වන එහි බලතල, කර්තව්‍ය හා කාර්ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන යම් නිලධරයන් සහ වෙනත් සේවකයන් පත් කරනු ලැබිය හැකි ය. කාර්යාංශයේ කාර්ය මණ්ඩලය පත් කිරීම

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට හා සේවකයන්ට මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට හා අනුප්‍රමාණයකට අනුව යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

14. (1) මණ්ඩලයේ ඉල්ලීම මත, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හෝ උතුරු පළාත් ආණ්ඩුකාරවරයාගේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කිරීම හෝ එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්යය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය. කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම

(2) යම් රජයේ නිලධරයකු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලබන අවස්ථාවක -

(අ) ඔහු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවේ දී, රාජ්‍ය සේවයේ ඔහුගේ ස්ථිර තනතුර, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් නම් -

(i) ඔහු කාර්යාංශයෙහි සේවයෙහි නියුක්ත කර ඇති අතරතුර, රාජ්‍ය ප්‍රතිපත්තිය මත වැටුප් රහිතව දෙන ලද නිවාඩු පිට රාජ්‍ය සේවයේ රාජකාරිය සඳහා නොපැමිණි ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ ව්‍යවස්ථා සංග්‍රහයේ 10 (1) වන වගන්තිය ඔහුට අදාළ විය යුතු ය; සහ

(ii) ඔහු කාර්යාංශයේ සේවයේ නියුක්තව සිටින සෑම සම්පූර්ණ මාසයක් සඳහා මුදල් විෂයය භාර පළාත් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුරෙහි ඔහුට ගෙවනු ලැබිය යුතු වැටුපෙන් සියයට විසිපහක් නොඉක්මවන යම් මුදලක් කාර්යාංශයේ අරමුදල්වලින් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා කාර්යාංශය විසින් ඔහු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයට ගෙවනු ලැබිය යුතු ය. සහ

(ආ) කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් ඔහු පත් කරනු ලැබූ අවස්ථාවේ දී, ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයකු වී සිටින්නේ නම්, කාර්යාංශයට ඔහු විසින් කරනු ලබන සේවය, ඒ ආඥාපනතේ කාර්යය

සඳහා අවස්ථානෝචිත පරිදි, ආණ්ඩුවට හෝ උතුරු පළාත් සභාවට කරනු ලබන සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ ආඥාපනත යටතේ ගෙවීමට ඔහු යටත්වන දායක මුදල ඔහු අරමුදලේ සේවයේ නියුක්ත කරනු ලැබ සිටින අතරතුර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට නොකඩවා ගෙවනු ලැබිය යුතු ය. තව ද, එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී කාර්යාංශයේ අරමුදල්වලින් ඔහු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට අවස්ථාවෝචිත පරිදි, ආණ්ඩුව හෝ උතුරු පළාත් සභාව යටත් වන දායක මුදලට සමාන මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ උචිත ගිණුමට බැර කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට කාර්යාංශය විසින් ඔහු සම්බන්ධයෙන් ගෙවනු ලැබිය යුතු ය.

(3) යම් රජයේ නිලධරයකු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලබන අවස්ථාවක -

(අ) ඔහු රාජ්‍ය සේවයෙන් අස්වූ ලෙස සළකනු ලැබිය යුතු ය.

(ආ) ඔහු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවේ දී, රාජ්‍ය සේවයේ ඔහුගේ ස්ථිර තනතුර, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් වූයේ නම් -

(i) කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ දින රාජ්‍ය සේවයෙන් ඔහු විශ්‍රාම ගන්වනු ලැබ තිබිණි නම් ඔහුට ගෙවනු ලැබිය හැකිව තිබූ ප්‍රදානයක් ලැබීමට, ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට සුදුසුකම් තිබිය යුතු ය;

(ii) වයස්ගත වීම නිසා හෝ අසනීපයක් හේතුවෙන් හෝ ඔහු විසින් ඒ කාර්ය මණ්ඩලයේ දරන ලද තනතුර අහෝසි කිරීම නිසා හෝ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් හෝ රාජ්‍ය පරිපාලන විෂයය භාර පළාත් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් හේතුවක් නිසා හෝ කාර්යාංශයේ කාර්ය මණ්ඩලයේ ඔහුගේ සේවා නියුක්තිය විශ්‍රාම ගැන්වීමෙන් අවසන් කරනු ලැබුවහොත් මිස, ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කරන ලද එවැනි යම් ප්‍රදානයක මුදල් ප්‍රමාණය ඔහුට ගෙවනු නොලැබිය යුතු ය. තව ද,

(iii) කාර්යාංශයේ සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින අතරතුර, ඔහුගේ මරණය සිදු වූ විට කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙරාතුව ම ඔහුගේ මරණය සිදු වී නම්, ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහු සම්බන්ධයෙන් කළ හැකිව තිබූ යම් ප්‍රදානයක් ඔහු සම්බන්ධයෙන් කරනු ලැබිය හැකි ය. තව ද,

(ඇ) කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවේ දී, ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකයකුව සිටියේ නම්, ඔහු සේවයෙන් පහ කිරීමෙන් නොව, අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුවේ හෝ උතුරු පළාත් සභාවේ කැමැත්ත ඇතිව, ගිවිසුම අවසන් වීමෙන් අවස්ථාවෝචිත පරිදි, ආණ්ඩුවේ හෝ උතුරු පළාත් සභාවේ සේවය අත්හරිනු ලැබූ ලෙස ඒ ආඥාපනතේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් සඳහා අවස්ථාවෝචිත පරිදි, ආණ්ඩුවට හෝ උතුරු පළාත් සභාවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග හෝ උතුරු පළාත් සභාව සමග ගිවිසුමකට එළඹ ඇති තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් කාර්යාංශයට කරනු ලබන යම් සේවා කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුවට හෝ උතුරු පළාත් සභාවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## III වන කොටස
## අරමුදල

කාර්යාංශයේ අරමුදල.

15. (1) කාර්යාංශයට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) කාර්යාංශයේ අරමුදලට -

(අ) කාර්යාංශයේ ප්‍රයෝජනය සඳහා උතුරු පළාත් සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) ආණ්ඩුව මගින් ප්‍රදානය කරනු ලබන සියලු මුදල්;

(ඇ) යම් ප්‍රදාන, පරිත්‍යාග සහ ත්‍යාග වශයෙන් ලැබෙන සියලු මුදල්; සහ

(ඈ) පහත සඳහන් ක්‍රමවලින් අය කරනු ලබන සියලු වෙනත් මුදල්,

I සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත සේවා පිහිටුවීම සඳහා උපදේශක සේවාවන් පුද්ගලයෙකුට/ ආයතනයකට ලබා දීම;

II සංචාරක ගමනාන්ත සඳහා නියමිත ස්ථාන පිහිටුවීමේ දී පළාත් පාලන ආයතනවලට උපදේශන ලබාදීම;

III සංචාරක ව්‍යාපාරය සම්බන්ධිත කරුණු ( උපදේශන ග්‍රන්ථ, අත් පත්‍රිකා, පැහැදිලි දෘශ්‍ය පටිගත කිරීම් හා වෙනත් බොහෝ දේ) පළ කිරීම මගින් එකතු කරනු ලබන මුදල්;

IV සිහිවටන/සමරු තිළිණ නිර්මාණය කිරීමේ යෙදී සිටින කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයන් උදෙසා අගය එකතුවන පුහුණු වැඩසටහන් ලබාදීම මගින් රැස් කරනු ලබන මුදල්;

(ඉ) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත පනතක් මගින් කාර්යාංශයේ අරමුදලට ලැබෙන වෙනත් ආකාරයෙන් රැස්වෙන වෙනත් සියලු මුදල්.

(3) කාර්යාංශයේ බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටුකිරීමේ දී කාර්යාංශය විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

16. කාර්යාංශයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය

17. (1) මණ්ඩලය විසින් කාර්යාංශයේ ආදායම හා වියදම සම්බන්ධයෙන් ද, වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ද, වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් ද නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) විගණනය සම්බන්ධයෙන් 1987 වසරේ අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) සහ 23(2)යන වගන්ති අදාළ වන අතර, උතුරු පළාත් සංචාරක කාර්යාංශයේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව විගණකාධිපති විසින් හෝ විගණකාධිපති විසින් පත් කරන ලද සුදුසුකම්ලත් විගණකවරයෙකු විසින් වාර්ෂික විගණන කිරීම සිදුකළ යුතුය.

## IV වන කොටස
## පොදු

18. අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයේ අනුමතය ඇතිව සහ ඔහු විසින් අවශ්‍ය යැයි සළකනු ලබන කවර හෝ අවස්ථාවක දී, ඔහු වෙත පනවන ලද හෝ පවරා දෙන ලද යම් කර්තව්‍යයක් හෝ කාර්යයක් කාර්යංශයේ යම් නිලධරයකු වෙත අභිනියෝජනය කළ හැකි අතර, එම නිලධරයා විසින් අධ්‍යක්ෂවරයාගේ විධානයට හා පාලනයට යටත්ව එම කර්තව්‍යය හෝ කාර්යය ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතු ය. අධ්‍යක්ෂවරයා විසින් ඔහුගේ කර්තව්‍ය අභියෝජනය කළ හැකි බව.

19. (1) දීර්ඝ කාලීන සංවර්ධන සැලැසුම්වලට අනුකූලව අධ්‍යක්ෂවරයා විසින් එක් එක වර්ෂයක දී ම, ඊළඟ වර්ෂය සඳහා වන වාර්ෂික සංවර්ධන සැලැසුම සැප්තැම්බර් මස 30 වන දින හෝ ඊට පෙර පිළියෙල කර, එයට අනුගාමීව අමාත්‍යවරයාටත් අනුමැතියටත් ඉදිරිපත් කළ යුතු ය. වාර්ෂික වාර්තාව.

(2) අධ්‍යක්ෂවරයා විසින් එක් එක් වර්ෂයක දී ම, පෙර වර්ෂය හා අදාළ කටයුතු පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් සෑම වර්ෂයකම පිළියෙල කර මණ්ඩලයටත්, එයට අනුගාමීව අමාත්‍යවරයාටත් ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන වාර්තාව අමාත්‍යවරයා වෙත සෑම වර්ෂයකම ජුනි මස 31 වැනි දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු ය.

(4) අමාත්‍යවරයාට ඒ වාර්තාව ලැබී මාස තුනක් ඇතුළත උතුරු පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

20. අමාත්‍යවරයා විසින් කලින් කල මෙම ප්‍රඥප්තිය යටතේ වන බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය වෙත පොදු හෝ විශේෂ විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර එවැනි විධානයන්ට අනුකූලව ක්‍රියා කිරීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය. අමාත්‍යවරයාගේ විධාන.

මණ්ඩලයේ සියලු සාමාජිකයන් රජයේ සේවකයන් ලෙස සැලකෙන බව.

21. මණ්ඩලයේ සියලු සාමාජිකයන් සහ කාර්යාංශයේ නිලධරයන්, සේවකයන් හා නියෝජිතයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

කාර්යාංශය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

22. (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව අදාල කාර්යාංශය උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලබන අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

සිවිල් හෝ අපරාධ නඩු පැවරීම්වලින් ආරක්ෂාව.

23. (1) (අ) මෙම ප්‍රඥප්තිය යටතේ කාර්යාංශය විසින් සද්භාවයෙන් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවකට එරෙහිව හෝ

(ආ) මණ්ඩලයේ යම් විධානයක් මත හෝ මෙම ප්‍රඥප්තිය යටතේ කාර්යාංශයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවකට එරෙහිව,

කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මණ්ඩලයේ නියෝගය මත,
කාර්යාංශයේ විධානය මත හෝ මෙම ප්‍රඥප්තිය යටතේ සිදු කරන ලද හෝ සිදු කරනු ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එකී ක්‍රියාව ඔහු විසින් සද්භාවයෙන් සිදු කරන ලද බවට අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම් (1)වන උපවගන්තිය යටතේ සඳහන් එවැනි යම් තැනැත්තකු විසින් දරන ලද යම් වියදම් කාර්යාංශයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

රෙගුලාසි.

24. මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ඉටු කිරීමට හෝ ඒවා ඵලාදයී වන අරමුණින් අමාත්‍යාවරයාට රෙගුලාසි සම්පාදනය කළ හැකි ය.

(1) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යාවරයා විසින් සාදනු ලබන සෑම රෙගුලාසියක්ම *ගැසට්* පත්‍රයෙන් පළ කළ යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයේ හෝ එම රෙගුලාසිවලින් නිශ්චිත කරනු ලැබූ ආකාරයේ ඊට පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යාවරයා විසින් සාදනු ලබන සෑම රෙගුලාසියක්ම *ගැසට්* පත්‍රයෙන් පළ කරනු ලැබූ දිනයේ සිට මාස තුනක කාල පරිච්ඡේදයක් තුළ අනුමැතිය සඳහා උතුරු පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එලෙස අනුමත නොකරනු ලැබූ යම් රෙගුලාසියක් එම අනුමැතිය ප්‍රතික්ෂේප කළ දිනයේ සිට නමුත් ඒ යටතේ කලින් කරනු ලැබූ කිසිවකට අගතියක් නොවන පරිදි පරිච්ජින්න වූ ලෙස සැළකිය යුතු ය.

(3) යම් රෙගුලාසියක් එලෙස අවලංගු කළ බවට සැළකිය යුතු දිනය පිළිබඳව දැන්වීමක් *ගැසට්* පත්‍රයෙන් පළ කරනු ලැබිය යුතු ය.

2005 අංක 38 දරන සංචාරක පනතේ විධිවිධාන අභිභවනය විය යුතු ය.

25. 2005 අංක 38 දරන සංචාරක පනතේ කිසියම් විධිවිධානයකට පටහැනිව මෙම ප්‍රඥප්තියේ කිසියම් විධිවිධානයක් තිබේ නම් 2005 අංක 38 දරන සංචාරක පනතේ විධිවිධාන අභිභවනය වේ.

අර්ථ නිරූපනය.

26. මෙම ප්‍රඥප්තියේ, ''ඇමතිවරයා'', යනු උතුරු පළාත් සංචාරක විෂයභාර ඇමතිවරයා ය.

අනනුකූලතාවක් ඇති වූ විට දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

27. මේ පනතේ දෙමළ,සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

02 - 02

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.